සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25A | S | I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 13 - 2018**

විභාග අංකය .............................

# ඉන්දියා ඉතිහාසය I

කාලය පැය තුනයි

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

- **අංක 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්න සඳහා නාම/ස්ථාන 5 බැගින් දී ඇත. එයින් එකක් අනෙක් ඒවා සමඟ නොගැලපේ. නොගැලපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය වරහන් තුළ ලියන්න.**

01. 1. තාම්‍රලිප්ත 2. සුප්පාරක 3. භාරුකච්ඡ
4. පාඨලීපුත්‍ර 5. කල්‍යාණි (.....)

02. 1. ජේලම් 2. චේනබ් 3. යමුනා
4. රාවි 5. බියස් (.....)

03. 1. මේඝදූතය 2. රඝු වංශය 3. ඍතු සංහාරය
4. ජානකීහරණය 5. කුමාර සම්භවය (.....)

04. 1. ග්‍රීක 2. කුෂාණ 3. සුංග
4. පහ්ලව 5. ශක (.....)

05. 1. වෛදික 2. බ්‍රාහ්මණ 3. ආරණ්‍යක
4. අථර්වන් 5. උපනිෂද් (.....)

06. 1. මොහෙන්ජොදාරෝ 2. සුක්තජොන්දෝර් 3. හරප්පා
4. ආම්රි 5. බයිබර් (.....)

07. 1. අශ්වමේධ 2. පුරුෂමේධ 3. හෝම
4. රාජසූය 5. වාජපේය (.....)

08. 1. රාමායනය 2. බෘහද්කථා 3. පංචතන්ත්‍රය
4. හිතෝපදේශය 5. කථා සරිත් සාගරය (.....)

09. 1. නිල්ගිරි 2. කාබුල් 3. වින්ධ්‍යා
4. අරවල්ලි 5. සාට්ස් (.....)

10. 1. බ්‍රාහ්මණ 2. ක්ෂත්‍රීය 3. ආරණ්‍යක
4. වෛශ්‍ය 5. ශුද්‍ර (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැලපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

11.
1. පුර - ඉන්දු ශිෂ්ටාචාරයේනගර හා බලකොටු
2. නිෂ්ක - මුදල් ඒකකයක්
3. දසාරාඥ - රජ මාළිගයේ ප්‍රධාන පූජක
4. වත්ස - කෞසම්බියේ අගනුවර
5. මණ්ඩලම් - චෝල පරිපාලන ඒකකයකි (.....)

12.
1. ටොලමි - ග්‍රීක
2. ප්ලිනී - පර්සියන්
3. ඉබන්බතුතා - අරාබි
4. තාරානාත් - ටිබෙට්
5. හියුංසාං - චීන (.....)

13.
1. හර්තෘහරී - ශංගාර ශතකය
2. ජයදේව - හිතෝපදේශය
3. බාණ - කාදම්බරිය
4. දණ්ඩීන් - දශ කුමාර චරිතය
5. ශුද්‍රක - මෘච්ඡ කටිකා (.....)

14.
1. කෝසල - පසේනදි
2. අවන්ති - වස්සකාර
3. මගධ - බිම්බිසාර
4. ගාන්ධාර - පුක්කුසාති
5. වත්ස - උදයන (.....)

15.
1. අලහබාද් සෙල්ලිපිය - සමුද්‍රගුප්ත රජු
2. බදාමිහි සෙල්ලිපිය - පළමුවන පුලකේශී රජු
3. හතිගුම්බා සෙල්ලිපිය - කාලවේල රජු
4. අශෝක සෙල්ලිපිය - අශෝක රජු
5. මැන්ඩසෝර් සෙල්ලිපිය - යශෝධර්මන් රජු (.....)

- **අංක 16 - 25 තෙක් වූ ප්‍රශ්නය සඳහා x හා y තීරුවල නාම/ප්‍රකාශන/දින වකවානු දී ඇත. y තීරුඅවේ දී ඇති නාම/ප්‍රකාශන දින වකවානු x තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. x තීරුව y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස්කළ විට පහත දී ඇති සංකේත පහෙන් එකක් නිවැරදිය. එම නිවරදි අංකය තෝරා වරහන තුළ යොදන්න.**

16.

| | X | | Y |
|---|---|---|---|
| 1. | පළමුවන චන්ද්‍රගුප්ත | A | බුදුරුව |
| 2. | දෙවන චන්ද්‍රගුප්ත | B | කුමාර දේවිය |
| 3. | සමුද්‍රගුප්ත | C | දේවරූප |
| 4. | වීම කැඩ්පයිසස් | D | සිංහයෙකුට විදීම |
| 5. | කණිෂ්ක | E | වීණාවක් අතින්ගෙන සිටීම. |

1. BEDAC 2. BDECA 3. BCDAE 4. BAEDC 5. BDCEA (.....)

17. X Y

| | X | | Y |
|---|---|---|---|
| 1. | සින්ධු | A | බටහිර දිශාවට |
| 2. | ගංගා | B | කාබුල් නිම්නය |
| 3. | බෝලාන් | C | උතුරු - දකුණ වෙන් වේ. |
| 4. | ඛයිබර් | D | සින්ධ් / රාජ්පුටාන |
| 5. | වින්ධ්‍යා | E | නැගෙනහිර දිශාවට |

1. AEDCB 2. ABCDE 3.AEDBC 4. ADEBC 5. ACBDE (.....)

18. X Y

| | X | | Y |
|---|---|---|---|
| 1. | අශෝක රජුගේ 4 වන ටැම් ලිපිය | A | අන්‍ය ආගම්වලට ගැරහීම නොකළ යුතුය. |
| 2. | අශෝක රජුගේ 13 වන ගිරි ලිපිය | B | ජනතාව රජු නිසා ප්‍රීතියට පත් නොවේවා |
| 3. | අශෝක රජුගේ ජෞගදා ලිපිය | C | තම යුධ හමුදාව ගැන කියවේ. |
| 4. | අශෝක රජුගේ 12 වන සෙල්ලිපිය | D | ජය ශ්‍රී මහා බෝධිය වැඳීමට ගිය බව කියවේ |
| 5. | අශෝක රජුගේ 8 වන ගිරි ලිපිය | E | වැරදි කරුවන්ට දඬුවම් දීම. |

1. ECBAD 2. EBCAD 3. EABDC 4. EADBA 5. ECBDA (.....)

19. X Y

| | X | | Y |
|---|---|---|---|
| 1. | ඩීම කැඩ්පයිසස් | A | පෙෂවෝර් |
| 2. | විෂ්ණු ගුප්ත | B | ඉන්දියන් නැපෝලියන් |
| 3. | සමුද්‍ර ගුප්ත | C | කුෂාණ වනප්තිය |
| 4. | වාසුදේව | D | අවසාන කුෂාණ පාලකයාය |
| 5. | කණිෂ්ක | E | ගුප්ත යුගයේ අවසානය |

1. CBEDA 2. CEBDA 3. CDBAE 4. CABDE 5. CBDEA (.....)

20. X Y

| | X | | Y |
|---|---|---|---|
| 1. | මොහොමඩ් | A | සාතවාහන |
| 2. | මහමුද් | B | නන්ද |
| 3. | චාලුක්‍ය | C | සෂ්නි |
| 4. | සාතකර්ණ | D | ඝෝර් |
| 5. | ධනනන්ද | E | කල්‍යාණ |

1. DECBA 2. DCEAB 3. DAEBC 4. DBACE 5. DEBCA (.....)

- **අංක 21 - 25 තෙක් සෑම ප්‍රශ්නයකටම නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

21. තුන්වන ධර්ම සංගායනාවෙන් පසු ස්වර්ණ භූමියට ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා යවන ලද භික්ෂූන් වහන්සේ,
1. මජ්ඣන්තික ථෙර 2. මහාදේව ථෙර 3. රක්ඛිත ථෙර
4. සෝණ - උත්තර ථෙර 5. මහින්ද ථෙර (.....)

22. 'අලහබාද් ප්‍රශස්තිය' අයත් රජතුමා වන්නේ,
1. අශෝක 2. I චන්ද්‍රගුප්ත 3. සමුද්‍රගුප්ත
4. II චන්ද්‍රගුප්ත 5. කුමාර ගුප්ත (.....)

23. ගුප්ත යුගය හැදෑරීමට ඇති සෙල්ලිපියක් නොවන්නේ,
   1. අලහබාද් ප්‍රශස්තිය 2. උදයගිරි 3. ජුනාගාර්ඩ්
   4. අශෝක ස්තම්භ 5. හිතරි ශිලා ලිපිය (.....)

24. 'පාල' රජ පෙළපතේ ආරම්භකයා වන්නේ,
   1. ධර්මපාල 2. දේවපාල 3. ගෝපාල
   4. ව්‍යාඝ්‍රපාල 5. නාරායන්පාල (.....)

25. ප්‍රයාග නගරයේදී පංච වාර්ෂික දානයක් දුන් රජතුමා කවුද?
   1. II චන්ද්‍රගුප්ත 2. කණිෂ්ක 3. හර්ෂ
   4. අශෝක 5. ධර්මපාල (.....)

- **අංක 26 - 30 දක්වා සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

26. ගුප්ත අධිරාජ්‍යය.
   1. I වන චන්ද්‍රගුප්ත රජු ක්‍රි.ව. 320 දී රජකමට පත්වී ''මහාරාජාධිරාජ'' යන විරුදය ලැබීය.
   2. විවාහ සබඳතා මගින් ගුප්ත අධිරාජ්‍යයට පදනම වැටීම.
   3. අලහබාද් ප්‍රශස්තියට අනුව සමුද්‍රගුප්ත රජු පිළිබඳ තොරතුරු බොහොමයක් හෙළිවීම.
   4. සමුද්‍රගුප්ත රජුගේ සටන් ව්‍යාපාරයේ අවස්ථා 4ක් දක්නට ලැබීම.
   5. ගුප්ත අධිරාජ්‍යයේ පරිහාණිය විදේශික ආක්‍රමණික කණ්ඩායමක් වූ කුෂාණවරු නිසා සිදුවීම. (.....)

27. කුෂාණයෝ,
   1. කණිෂ්ක කුෂාණ යුගයේ වැදගත්ම පාලකයා වීම.
   2. කුෂාණ යුගයේදී සංස්කෘතික අභිවර්ධනය සිදුවීම.
   3. සිව්වන ධර්ම සංඝායනාව කණිෂ්ක යුගයේදී පැවැත්වීම.
   4. ථෙරවාදී බුදු දහමේ වර්ධනය හා ව්‍යාප්තිය මෙකල සිදුවීම.
   5. ප්‍රථම බුදුරුව නිර්මාණය වීම. (.....)

28. පල්ලවයන්ගේ දේශපාලන හා සංස්කෘතික කටයුතු,
   1. කාංචි නගරය පල්ලවයන්ගේ ප්‍රධාන පාලන මධ්‍යස්ථානය වීම.
   2. උතුරින් ක්‍රිෂ්ණ නදියේ සිට දකුණින් කාවේරි නදිය දක්වා පල්ලවයන් සතුවීම.
   3. සිංහ විෂ්නු රජු, චෝල, චේර හා පාණ්ඩ්‍යයන් පරාජය කර කාවේරිදක්වා බලය ව්‍යාප්ත කරවීම.
   4. පල්ලව රජවරුන් ශ්‍රී ලංකාවේ II සේන රජු හා පැවති සබඳතා
   5. ලෙන් දේවාල, නිර්මිත දේවාල, රථ දේවාල, මණ්ඩප සහ වාස්තු විද්‍යා ලක්ෂණ පල්ලව යුගයේ දක්නට ලැබීම. (.....)

29. ත්‍රෛපාක්ෂික අරගල,
   1. සියවසට ආසන්න කාලයක් උතුරු ඉන්දියාවේ දේශපාලන ඒකාග්‍රතාවයක් ඇති කිරීම.
   2. ත්‍රෛපාක්ෂික අරගලයට ගුර්ජර - ප්‍රතිහාරයන්ගේ දායකත්වය.
   3. අටවන සියවස මැද දී පමණ චාලුක්‍යයන්ගෙන් මහා රාෂ්ට්‍රය පැහැරගෙන එහි රාෂ්ට්‍රකූට බලය ව්‍යාප්ත කිරීම.
   4. සසංක රජුගේ මරණයත් සමඟ බෙංගාලය දේශපාලන වශයෙන් දුර්වල වීම.
   5. ප්‍රතිහාර හා රාෂ්ට්‍රකූට අරගල නිසා දේවපාල රජු බලවත් වීම. (.....)

30. අරාබි හා තුර්කි ආක්‍රමණ
   1. ඉරාකයේ ප්‍රදේශ පාලක අල් - හජ් - ජාජ් ඉන්දියාව තුන්වරක් ආක්‍රමණය කිරීම.
   2. සින්ද් හා මුල්තාන් ප්‍රදේශ ඇතුළත් බටහිර ඉන්දියාව සියවස් එක හමාරක් පමණ කාලිෆ්වරු යටතේ පැවතීම.
   3. ඝස්නියේ මහමුද් 10 වතාවක් ඉන්දියාව ආක්‍රමණය කිරීම.
   4. මහමුද් - බින් - කාසිම්ගෙන් පසුව අරාබි පාලනය බිඳ වැටීම.
   5. ඇෆ්ගනිස්ථානයේ ''ඝස්නියේ මුල් කරගෙන අල්ප්තිජිත් නැමැත්තා මුස්ලිම් රාජධානයක් පිහිටුවීම.
   (.....)

* **අංක 31-35 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති A,B,C, හා D යන ප්‍රතිචාර හතර අතරින් එකක් හෝ කීපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා**

Aහා B පමණක් නිවැරදි නම් අංක 1 ද    B හා C පමණක් නිවැරදි නම් අංක 2 ද
C හා D පමණක් නිවැරදි නම් අංක 3 ද    A හා C පමණක් නිවැරදි නම් අංක 4 ද

**ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි ගණනක් නිවැරදි නම් අංක 5 ද අදාළ හිස්තැනෙහි ලියන්න.**

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | A හා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැදිය. |

31. ඉන්දු නිම්නයේ ආගමික ඇදහිලි.
A) මව්දෙවඟන පිදීම
B) යන්ත්‍ර මන්ත්‍ර බලිබිලි පිදීම.
C) යාග - හෝම පැවැත්වීම
D) බ්‍රහ්ම- විෂ්ණු - ඊශ්වර දෙවිවරු ඇදහීම.(.....)

32. ගුප්ත අධිරාජ්‍ය බිඳ වැටීමට හේතු
A) සමුද්‍රගුප්ත අධිරාජයා ගුප්ත ආධිරාජයේ පාලකයා වීම.
B) රාජ්‍ය පදප්‍රාප්තිය පිළිබඳව ස්ථාවර නීති සම්ප්‍රදායක් නොවීම.
C) හූණ ආක්‍රමණ
D) ස්කන්ධ ගුප්ත රජුගෙන් පසු බලවත් රජවරුන් බලයට පත්වීම. (.....)

33. අශෝක රජුගේ ආගමික ප්‍රතිපත්ති
A) රටවැසියාගේ සුව පහසුව සලකා කටයුතු කළේය.
B) රජතුමා අසූහාර දහසක් වෙහෙර විහාර කරවන ලදී.
C) අශෝක රජුගේ කාලයේ තෙවන ධර්ම සංගායනාව පවත්වන ලදී.
D) අශෝක රජු ජෛන ආගමිකයෙකි. (.....)

34. උජ්ජෙයිනියේ රුද්‍රාදාමන් රජු
A) සාතකර්ණී රජු දෙවරක් පරාජය කළේය.
B) මහා ක්ෂත්‍රප යන විරුදාවලියෙන් හැඳින්විණි.
C) උජ්ජෙයිනිය කුෂාණ පාලනයෙන්මුදාගෙන එහි තම අගනුවර පිහිටුවීය.
D) කාණ්ව රජ පෙළපතේ ශ්‍රේෂ්ඨතම පාලකයා විය. (.....)

35. චන්ද්‍රගුප්ත මෞර්ය රජතුමා
A) විවාහ සබඳතා නිසා ප්‍රදේශ ගණනාවක් අධිරාජ්‍යයට සම්බන්ධ කරගත හැකිවිය.
B) ඇෆ්ගනිස්ථානයේ කුෂාණයන්ට විරුද්ධව කළ සටනින් මොහු පරාජය විය.
C) චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ අවසාන කාලය ශ්‍රවණ බෙල්ගෝලාහි ජෛන භක්තිකයෙකු ලෙස ගත කළේය.
D) චන්ද්‍රගුප්ත මෞර්ය රජු සෙලියුකස් නිකේටර්ට විරුද්ධව සටනට ගොස් ඔහු පරදවා ගිවිසුමකට එළඹියේය. (.....)

- **36 සිට 40 දක්වා ප්‍රශ්නවල අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4, හා 5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 1. නිවැරදිය | නිවැරදිය |
| 2. නිවැරදිය | වැරදිය |
| 3. වැරදිය | වැරදිය |
| 4. වැරදිය | නිවැරදිය |
| 5. නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. භාරතයන්ගේ සටන පිළිබඳ තොරතුරු දැක්වෙන වෘත්තාන්තය මහා භාරතයයි. | මෙම සටන සිදුවූයේ නර්මදා නදිය ආසන්නයේය. (.....) |
| 37.අශෝක රජු යටතේ මහාමාත්‍රවරුන්ට පැවරී තිබුනු රාජකාරිය වූයේ වැසියන් අතර බුද්ධාගම ප්‍රචාරය කිරීමයි. | ධර්ම මහාමාත්‍රවරුන්ගේ වගකීම වූයේ අශෝක ධර්මය ප්‍රචාරය කිරීමයි. (.....) |
| 38. පල්ලව බලය පිහිට වූ සිංහ විෂ්ණු රජු 'මත්තවිලාශ ප්‍රහසන'' යන විරුදයෙන් හඳුන්වන ලදී | බදාමිය පල්ලවයන්ගේ අගනුවරය විය. (.....) |
| 39. මහා ඇලෙක්සැන්ඩර් වයඹ දිග ඉන්දියාව අල්ලාගෙන එය ඔහුගේ ප්‍රාන්තයක් බවට පත්කර ගත්තේය. | එම ප්‍රදේශයේ පාලනයට සෙලියුකස් නිකේටර් පත් කරන ලදී. (.....) |
| 40. II පුලකේෂීන් රජු විසින් හර්ෂවර්ධන රජු පරාජය කරන ලදී. | මෙම පරාජයෙන් පසු හර්ෂවර්ධන රජුගේ රාජ්‍යයේ දකුණු සීමාව වූයේ නර්මදා නදියයි. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

25A | S | II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 13 - 2018**

විභාග අංකය ............................ ඉන්දියා ඉතිහාසය II

උපදෙස්

♦ පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

**පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.**

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | |
|---|---|
| (i) ඛයිබර් දුර්ගය | (v) පාඨලීපුත්‍ර |
| (ii) මධුරෙයි | (vi) භාරුකච්ඡ |
| (iii) ජූනාගාද් | (vii) කෘෂ්ණ නදිය |
| (iv) පුරුෂපුරය | (viii) වින්ධ්‍යා කඳුවැටිය |

නිවැරදිව ලකුණු කොට නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි. (ල.18)

02. ඍග් වෛදික ආර්යයන්ගේ දේශපාලන, ආර්ථික හා සමාජීය ජීවිතය විස්තර කරන්න. (ල. 14)

03. ''අශෝක අධිරාජයාගේ අරමුණ වූයේ සාමාකාමී රාජ්‍යයක් ගොඩනැගීමයි'' මෙම ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න. (ල. 14)

04. ''ගුප්ත යුගය ඉන්දියා ඉතිහාසයේ සම්භාව්‍ය යුගය ලෙස වර්ණනා කෙරේ''
    (i) ගුප්ත යුගය පිළිබඳ වටිනා තොරතුරු ලබාදෙන විදේශීය සංචාරකයන් දෙදෙනෙකු නම් කරන්න. (ල. 2)
    (ii) ගුප්ත පාලකයන් විසින් භාවිතා කළ රාජකීය විරුද නාම 2ක් දක්වන්න. (ල. 2)
    (iii) ගුප්ත යුගයේ වැදගත් සංස්කෘතික ලේඛකයන් තිදෙනෙකු නම් කරන්න. (ල. 3)
    (iv) ගුප්ත යුගය ඉන්දීය ඉතිහාසයේ සම්භාව්‍ය යුගයක් ලෙස හඳුන්වන්නේ ඇයි දැයි සාකච්ඡා කරන්න. (ල. 7)

05. මෞර්ය අධිරාජ්‍ය පිරිහීම හා බිඳවැටීම පහත සඳහන් සාධක කෙරෙහි අවධානය යොමු කරමින් පැහැදිලි කරන්න.
    1. රාජසභාවේ පැවති අභ්‍යන්තර ගැටුම්.
    2. දුර්වල පාලකයින් බලයට පත්වීම.
    3. අශෝක රජුගේ ප්‍රතිපත්ති.
    4. විදේශ ආක්‍රමණ එල්ලවීම. (ල. 14)

06. ක්‍රි.පූ. හයවන සියවසේ පැවතුනු මහා ජනපද අතර මගධ ජනපදය බලවත් වීමට බලපෑ භෞතික සාධක හා මානව සාධක උදාහරණ සහිතව පෙන්වා දෙන්න. (ල. 14)

07. පල්ලවයන් යටතේ ඉන්දියාවේ ඇති වූ දේශපාලනික හා සංස්කෘතික කටයුතු පිළිබඳ විස්තර කරන්න. (ල. 14)

08. එක්කෝ A කොටසට නැතහොත් B කොටසට පමණක් පිළිතුරු සපයන්න.

(A) ඩෙකැනයේ සාතවාහන පාලකයන්ගේ කාර්ය සංසිද්ධීන් විමසන්න. (ල. 14)

(B) ඉන්දු - ග්‍රීක හා ශක ආක්‍රමණ හා ඒවායේ ප්‍රතිඵල පරීක්ෂා කරන්න. (ල. 14)

09. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම දෙකකට ඓතිහාසික සටහන් ලියන්න.

(i) සිව්වන ධර්ම සංගායනාව.

(ii) හරප්පා ශිෂ්ඨාචාරයේ නගර සැලසුම්කරණය

(iii) ගණ රාජ්‍යවල පරිපාලන ක්‍රමය


(iv) පැරණි ඉන්දියාවේ අධ්‍යාපන ආයතන.

(එක් කොටසකට ලකුණු 7 බැගිනි)

**12 / 13 ඉන්දියා ඉතිහාසය** - 12 / 13 இந்திய வரலாறு

විභාග අංකය
சுட்டெண்

| |
|---|
| |




**දෙවන වාර පරීක්ෂණය - ඉන්දියා ඉතිහාසය.**
**පිළිතුරු 13 - ශ්‍රේණිය 1 කොටස**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 4 | 11. | 3 | 21. | 4 | 31. | 4 |
| 2. | 3 | 12. | 2 | 22. | 3 | 32. | 2 |
| 3. | 4 | 13. | 3 | 23. | 4 | 33. | 5 |
| 4. | 1 | 14. | 2 | 24. | 3 | 34. | 1 |
| 5. | 1 | 15. | 5 | 25. | 3 | 35. | 3 |
| 6. | 5 | 16. | 2 | 26. | 5 | 36. | 1 |
| 7. | 3 | 17. | 3 | 27. | 4 | 37. | 4 |
| 8. | 1 | 18. | 2 | 28. | 4 | 38. | 3 |
| 9. | 2 | 19. | 3 | 29. | 5 | 39. | 2 |
| 10. | 3 | 20. | 2 | 30. | 3 | 40. | 5 |

(ලකුණු 40)

**<u>11 පත්‍රය - පිළිතුරු</u>**




01. කරුණු දක්වා ඇත ආකාරයට සුදුසු පරිදි පිළිතුරු ලබා දෙන්න.

02. **<u>දේශපාලන :</u>**
* ගෝත්‍රික කණ්ඩායම් වශයෙන් පැමිණීම. * ගෝත්‍රයේ නායකයා රාජන් නමින් හැඳින්වීම. * භරත, පුරු, යදු, තුර්වාශ, අනු, දෘහස්‍ර, ඍග් වෛදික සමාජයේ ප්‍රකට ඒවා වීම.* දශ රාඥ යුද්ධයේදී රජවරුන් දස දෙනෙකු භරත ගෝත්‍රයේ සුදාස් රජුට එරෙහිව කල යුද්ධයෙන් සුදාස් රජු ජය ගැනීම. * මෙකල පාලන බලය ලබා ගැනීමට ආනර් ගෝත්‍ර සමඟද සටන් පැවතීම. * ගමේ පාලනය ගමේ පවුල්වලට පමණක් සීමා වීම. * පාලන කටයුතුවලදී රාජන් වරයාගේ සහායට සමිති ා සභා යනුවෙන් පාලන ආයතන 2ක් තිබීම.

**ආර්ථික :**

* ජීවන ක්‍රමය සරල එකක් වීම. * සංචාරක ජීවිතය අත්හල මොවුන් තැනින් තැන ගම් පිහිටුවා ගෙන කෘෂි කාර්මික ජීවිත ගත කරන්නට පටන් ගැනීම. * ප්‍රධාන රැකියාව කෘෂිකර්මය. * ජලය ලබා ගැනීම සඳහා වාරි ක්‍රම භාවිතා කරන ලදී. * යමුනා නදී තීරය ගව සම්පතට ප්‍රසිද්ධය. ගොනුන් ගමනාගමන කටයුතුවලටත් හරක් මස් ආහාරය සඳහාත් යොදා ගැනීම. * විවිධ කර්මාන්ත ශ්‍රේණි තිබීම. * රන්කරුවන්, වඩුවන්, ලෝහ භාණ්ඩ සාදන්නන්, රෙදි වියන්නන්, හම්කරුවන්, දඩයම් කරුවන්, මැණික් කරුවන්, දලි රැවුල් කපන්නන් වැනි කර්මාන්තකරුවන් සිටියහ.

**සමාජ ජීවිතය :**

* ග්‍රාමීය ලක්ෂණ දක්නට ලැබීම. * සමාජය විවිධ ගෝත්‍රවලින් සකස් වී තිබීම. * පීතෘ මූලික සමාජයක් පැවතීම. * වෛදික සමාජයේ පුළුල් අයුරෙන් සිරිත් විරිත් ආරක්ෂා කිරීම. * පිරිමි දරුවකු ලැබීමෙන් පවුලේ ධන සම්පත් රැකෙන බවත් දියණියක් ලැබීමෙන් පවුලේ ධනය පිටට යන බවත් සමාජයේ සාමාන්‍ය පිළිගැනීම වීම. * ඒක භාර්යා සේවනය හා බහු භාර්ය විවාහ තිබීම. * වර්ණ භේදය නැත. * ස්වභාවික වස්තූන්ට වන්දනාමාන කළහ. * සරල යාග පැවැත්වූහ. * මෙකල සමාජයේ බහුදේව සංකල්පය තිබීම. (ල. 14)

03. * කාලිංග යුද්ධයෙන් පසු අශෝක දිග් විජය ප්‍රතිපත්තිය අතහැර ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කිරීම.
* බුදු දහම වැළඳ ගැනීමෙන් පසු අශෝක ධර්මය ප්‍රචාරය කිරීමට පියවර ගැනීම.
* දෙපා සිව්පා සතුන් කෙරෙහිද, පක්ෂීන්, මත්ස්‍යයින් කෙරෙහිද ප්‍රාණ දානය හෙවත් අභය දානය දීම.
* මව්පියන්ට, වැඩිහිටියන්ට කීකරු වීම, සතුන් කෙරෙහි දයාව දැක්වීම. * ගුරුවරුන්ට නෑදෑහිතවතුන්ට, මහණ බමුණන්ට සංග්‍රහ කිරීම. දන් දීම. පර පණ නොනැසීම ආදිය අශෝක ධර්මයේ අඩංගු වීම.
* යාග හෝම සඳහා සතුන් මැරීමෙන් වැළකීම.
* රාජ්‍ය තුළ ධර්ම ප්‍රචාර කටයුතු සිදු වූ අයුරු සොයා බැලීමට ධර්ම මහාමාත්‍ර නිලධාරීහු පත් කිරීම.
* රජු සියලු ආගම්වලට අනුග්‍රහ දැක්වීම.
* රටතුළ පමණක් නොව මුළු ලොවටම තමා යහපත් යැයි කියූ දේ කියාදීම.
* තුන්වන ධර්ම සංඝායනාවෙන් පසු විදේශීය රටවල් නවයකට ථෙරවාදී බුද්ධ ධර්මය ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම.
* රජු මිනිසුන්ට මෙන්ම සතුන්ටද රෝහල් ඉදිකිරීම. (ල. 14)

04. (i) පාහියං / ඉන්සිං

(ii) මහාරාජාධිරාජ/වික්‍රමාදිත්‍ය/පරමභගවත/කවිරාජ්/ශතාරි / සර්ව රජාචේත්‍රී

(iii) කාලිදාස/විශාඛදත්ත/ශූද්‍රාත / හරිසේන/භාස/භවභූති

(iv) ශක්තිමත් ආණ්ඩුවක් පිහිටා තිබීම. * දියුණු ආර්ථික රටාවක් පැවතීම. * අටවික රජවරු පරාජය කිරීම. * පළමු චන්ද්‍රගුප්ත රජු ගේ සිට සමුද්‍රගුප්ත රජු දක්වා විශාල ප්‍රදේශයක බලය ව්‍යාප්ත කර ගනිමින් ගුප්ත අධිරාජ්‍ය විශාල වීම. * අලහබාද් ප්‍රශස්තියට අනුව සටන් සියයක වීරයා නමින් සමුද්‍රගුප්ත හඳුන්වන්නේ මෙලෙස විශාල ප්‍රදේශයක් ගුප්ත රාජ්‍යයට ඈඳා ගැනීම. * කාර්යක්ෂම පාලන ක්‍රමයක් ගෙනයාමට සමත් වීම. * රජු යටතේ නිලධාරීන් විශාල පිරිසක් සේවය කිරීම. කෞටිල්‍යගේ අර්ථ ක්ෂේත්‍රයට අනුව කාර්මික, වෙළඳ හා ශිල්ප ශ්‍රේණි මේ යුගයේදී සංවිධානාත්මක ලෙස පැවතීම. සාහිත්‍ය ක්ෂේත්‍රය උපරිම දියුණුවක් ලැබීම. * බෞද්ධාගමික ගෘහ නිර්මාණ ශිල්පය දියුණු වීම. * බෞද්ධ හා හින්දු ප්‍රතිමා නෙලීම. සමකාලීන ඉන්දියාවේ ජන ජීවිතය අජන්තා චිත්‍රවලින් නිරූපණය වීම.

05. * අශෝක රජුගෙන් පසු සංකීර්ණ පාලන තන්ත්‍රයක් ගෙනයාමට දක්ෂ පාලකයෙකු බිහි නොවීම.
* දුර්වල පාලකයන්ගේ කාලවලදී ප්‍රාදේශීය පාලකයින් ස්වාධීන වීම. * අධිරාජ්‍යත්වයේ විශාලත්වය.
* අශෝක රජුගේ බෞද්ධාගමික පක්ෂපාතීත්වය නිසා බ්‍රාහ්මණ විරෝධී ප්‍රතිපත්තියක් ඇති වූ බවට පවතින මතය. * අශෝක රජුගේ අවිහිංසාවාදී ප්‍රතිපත්තිය නිසා හමුදා නිලධාරීන් අක්‍රීය වීම.
* රාජ සභාවේ අභ්‍යන්තර ගැටුම්. * ආර්ථික පරිහානියක් ඇතිවීම. * දේශ සීමාවන්හි ආරක්ෂාව දුර්වල වීම. * විදේශ ආක්‍රමණ. * ශුංග වංශික කැරැල්ල ආසන්න හේතුව වීම.

06. * චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ ක්‍රියා කලාපය. * කෞටිල්‍යගේ අනුග්‍රහය චන්ද්‍රගුප්ත මෞර්යයට ලැබීම.
* විශාල යුධ හමුදාවක් රැස්කර ධනනන්දට විරුද්ධව සටන් මෙහෙයවා ධනනන්ද මරා මගධයේ බලය ලබාදීමට කෞටිල්‍ය උනන්දුවීම. * වයඹදිග ඉන්දියාව සෙලියුකස් නිකේටර් සමඟ ගිවිසුමකින් මගධය යටත් කර ගනී. * දකුණු ඉන්දියාවේ තින්නවේලි දක්වා බලය ව්‍යාප්ත කිරීම. * ඔහුගේ පුත් බිංදුසාර යුද්ධ නොකළත් නගර 16ක බලය ආරක්ෂා කරගනිමින් රාජ්‍ය රැක ගැනීම. * එකල ආර්ථිකයද ශක්තිමත් වීම. විවිධ මාර්ගවලින් රජයට බදු ලැබීම. * ශුල්ක හෙවත් බදුවලින් ලැබුණු ආදායම රාජ්‍ය නිලධාරීන්ට වැටුප් ගෙවීමට හා යුද්ධ හමුදාව නඩත්තුවට වැය කරන ලදී. * රටේ ආර්ථිකය ශක්තිමත් වීම මෞර්ය අධිරාජ්‍යයේ වර්ධනයට බෙහෙවින් බලපෑම.

07. **දේශපාලන :**
* සිංහ විෂ්ණු රජු චෝළ චේර හා පාණ්ඩ්‍ය බලය මර්ධනය කර බලය ව්‍යාප්ත කිරීම.
* පළමුවන මහේන්ද්‍ර වර්මන් රජු තව දුරටත් බලය ව්‍යාප්ත කිරීම. * පළමුවන නරසිංහ වර්මන් දෙවන පුලකේශීන්ගේ ආක්‍රමණ මැඩපැවැත්වීම. * චාලුක්‍ය දේශය ආක්‍රමණය කිරීම. * පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කිරීම. * ලංකාවේ මානවම්ම රජු සමග සබඳතා පැවැත්වීම.

**සංස්කෘතික :**
* පල්ලව යුගයේ ආගමික පුනර්ජීවනය සමග ගෘහ නිර්මාණ ශිල්පීන්ද වර්ධනයක් සිදු වීම. * පර්වත හාරා දේවාල තැනීමේ සම්ප්‍රදාය මෙකල දියුණු වීම. * මහේන්ද්‍ර ශෛලියේ දේවාලවල කුළුණු සහිත ලෙන් දේවාල තැනීම. * පසු කාලයේද ගල් හා ගඩොල් භාවිතා කර දේවාල නිර්මාණය කිරීම. * මෙම නිර්මාණ හා සම්බන්ධ සෙල්මුවා, මූර්ති, බිත්ති කුළුණු අලංකාර කැටයම්වලින් බහුල වීම. * මේවා ජීවමාන මෙන්ම තාත්විකව නිමවා තිබීම.

08. (A) * ශුංග කාන්ව රාජ වංශ යටපත් කොට ඩෙකෑනයේ නැගීසිටි රාජ වංශය සාතවාහවයක් ලෙස සැලකීම. * මුල් පාලකයා සිමුඛ නැමැත්තාය. * මොවුන් ඩෙකෑනය හරහා බටහිරට සංක්‍රමණය වී ප්‍රතිස්ඨාන ප්‍රදේශය කේන්ද්‍රකොටගෙන මහාරාෂ්ට්‍ර හා මාල්වා අවට ප්‍රදේශවල බලය ව්‍යාප්ත කිරීම.

* ඔහුගෙන් පසු අවුරුදු 18 ක් පමණ කෘෂ්ණ නැමැත්තකු බලයට පත්වීම. * පසුව ඔහුගේ පුත් සාතකර්ණි රජු වසර 56 ක් රාජ්‍ය පාලනය කිරීම. * එය සනාථ කිරීමට අශ්ව මේද යාග 2ක් පවත්වා ඇත. * ග්‍රීක, ශාක, පාර්තීය, බලයන් යටතේ ඩෙකෑනයේ සාතවාහන බලය දුර්වල වුවත් ඔවුන් පරාජය කර බලය ලබාගන්නේ ගෞතම් පුත්‍ර ශාතකර්ණි රජුය. ඔහු නහපාන නම් ශකරජු පරාජය කොට අවන්ති, මාල්වා, කයිවාර්, අනුපදේශ, අයමක, විදර්භා, උතුරු කොන්තන්, ක්‍රිෂ්ඨ, ගෝධාවරී ගංගා දක්වාද බලය ව්‍යාප්ත කරන ලදී. * සාතවාහන රජවරු කෘෂිකර්මය, වෙළඳම, කර්මාන්ත යන ක්ෂේත්‍රවල වර්ධනයක් ඩෙකෑනට තුළ ගෙන ගියහ. * ශ්‍රේණි ක්‍රමයක් යටතේ ආර්ථික කටයුතු වර්ධනය කරන ලදී. * ඩෙකෑනයේ ආගමික හා සංස්කෘතික අනිවාර්ධනයක් ඇතිකිරීමට සාතවාහන රජවරු උනන්දුවීම. * ඩෙකෑනයේ දේශපාලන ආර්ථික මෙන්ම සංස්කෘතික අනිවර්ධනයේ පුරෝගාමීන් ලෙසින් සාතවාහන රජවරුන් හැඳින්වීම.

(B) * ක්‍රි.පූ. 250 අවසාන භාගයේදී බ්‍රැක්ටියාවේ නිමෙට්‍රියස් රජු විසින් ඉන්දියාවට ආක්‍රමණයක් එල්ල කරමින් සිය බලය යොදා ඝණබය, මථුරා, පංචාල, සාකල, යන ප්‍රදේශ අල්ලා ගැනීමත් සමඟ ඉන්දු ග්‍රීකයන්ගේ ග්‍රහණයට ඉන්දියාව නතු වීමේ ආරම්භය ඇති වේ. * ඉන්දු ග්‍රීකයන්ගේ ශ්‍රේෂ්ඨතම පාලකයා ලෙස මියැන්ඩර් රජු හැඳින්විය හැක. * ඔහුගෙන් පසු පළමුවන ස්ට්‍රාබෝ ද අනතුරුව දෙවන ස්ට්‍රාබෝද බලයට පත්විය. * ඇන්ටියල් කිඩාස් නම් ග්‍රීක රජු තම අගනුවර ලෙස තක්ෂිලාව තෝරාගෙන එම ප්‍රදේශය යටත් කරන ලදී. * ඉන්දු ග්‍රීක පෙළපතේ අවසාන පාලකයා වූ හර්මයියෝස්. පාලන බලය ලබාගත්තත් පාර්නියන්වරු ඔහු පරාජය කරන ලදී.

09. (i) * කණිෂ්ක රජුගේ අනුග්‍රහයෙන් පැවැත්වීම. * කාශ්මීරයේ කුණ්ඩලවනවිහාරයේ පැවැත්වූ බව හියුංසාගේ මතයයි. පංජාබයේ ජලන්ධාරයේ පැවැත්වූ බවටද මතයක් පවතී. ප්‍රධානත්වය ගත්තේ වසුමිත්‍ර තෙරුන්ය." අශ්වඝෝෂ හිමියන්ගේ අනුශාසකත්වය ලැබුණි. * මාස 6ක් තිස්සේ පැවැත්වූ මෙයට භික්ෂූන් 500 ක් පමණ සහබාගි වී ඇත. * මීට හේතුවූයේ කණිෂ්ක රජුගේ කාලයේ බුදු සමය නිකාය 18 කට බෙදී තිබීමයි. ඒ ඒ නිකායවාදීන් ඉදිරිපත් කළ මතවාද නිසා බුදු සමය අපිරිසිදු වී ඇතැයි සැලකූ කණිෂ්ක රජු පාර්ශව තෙරුන් හා සාකච්ඡා කොට සංගායනාවක් පැවැත්වීමට තීරණය කරන ලදී. සර්මාෂ්තික, පූර්වශෛලීය, අපරශෛලීය, විමංසා, න්‍යායික වැනි විවිධ නිකායිකයින්ගේ මති මතාන්තර විමර්ශනය කොට ශාසනය පිරිසිදුකිරීමට වෙය පැවැත්වීය.

(ii) * සින්දු ගංගාධාරය ආශ්‍රිතව ගොඩනැගුණු හරප්පා ශිෂ්ටාචාරය ඉතාමත් දියුණු නගර නිර්මාණයකින් තනා තිබීම. මොහෙන්ජොදාරෝ සහ හරප්පා නගර දෙක මුල් කරගෙන මෙ නාගරික ලක්ෂණ අධ්‍යයනය කළ හැකිවේ. මෙහි පැරණිම නගරය හරප්පා ලෙස සැලකෙන අතර වඩාත් හොඳින් ආරක්ෂා වී ඇති නලගර මොහෙන්ජොදාරෝ නගරයයි. මෙම නගර දෙකේම වඩාත් කැපී පෙනෙන ලක්ෂන නම්නගර සැලසුම් සහගතව ඉදිකර තිබීමයි. මෙහි නාගරික අංග ලක්ෂණ පෙන්වන අංශ කීපයකිත. නගරය ඇතුළු නුවර හා පිටි නුවර වශයෙන් කොටස් දෙකකි. ඇතුලු නුවර ප්‍රධාන ගොඩනැගිලි හා පිටිනුවර සාමාන්‍ය ජනයාගේ ගෙවල් තනා තිබුණි. නගරයට පිවිසීමේ මාර්ග පද්ධතිය ක්‍රමානුකුල විය.

(iii) * ඉන්දියාවේ ක්‍රි.පූ. 6 වන සියවස වන විට පැවති රාජාණ්ඩු පාලන ක්‍රමයෙන් බැහැරව ගණ හෝ සංඝ නමින් හැඳින්වූහ. * සමූහාණ්ඩු ක්‍රමයට බොහෝ දුරට සමාන ලක්ෂණ ඇති පාලන සංවිධානයක් ලෙස මෙම රාජ්‍යයක් තිබුණි. * මෙම රාජ්‍යයන් පිළිබඳ බොහෝ තොරතුරු බෞද්ධ මූලාශ්‍රවලින් ලබාගත හැකිය. * උතුරු ඉන්දියාවේ එවැනි සණ රාජ්‍ය 10ක් පමණ තිබුණ අතර මෙම පරිපාලන රටාවේ ලක්ෂණ බෞද්ධ මූලාශ්‍රවල ද දැක්වේ. * මෙම රාජ්‍යවල පාලකයෝ බොහෝ ගණනක් වූහ. * පාලන ප්‍රධානීන් රාජා යන තනතුරු නාමයෙන් හඳුන්වන ලදී. * රජවරු සියලු දෙනාම එකතු වී රාජ්‍ය පිළිබඳ සෑම ප්‍රශ්නයක්ම

විවෘතව සාකච්ඡා කර විසඳ ගැනීමට පාලන සභාවේ ප්‍රධාන ලක්ෂණයවේ. * මේ සඳහා ලිච්ඡවි හු රැස් වූයේ විශාලා මහනුවර සන්ථාගාර ශාලාවලටය. එහිදී යෝජනා ඉදිරිපත් කිරීම. ඒවාතුන්වරක් කියවාවිරෝධතා මතු නොවූයේ නම් ඒකමතිකව සම්මත කර ගැනීම සිදුවිය. විරෝධතා මතුවූයේ නම් ප්‍රශ්නය සාකච්ඡා කර වැඩි ඡන්දයෙන් සම්මත කර ගනී. බොහෝ දුරට මෙම රාජ්‍යවල පැවැතියේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයකි.

(iv) * බෞද්ධ අධ්‍යාපනයේ ආභාෂය ලබමින් ඉන්දියාවේ අධ්‍යාපන ක්‍රමය හා අධ්‍යාපන ආයතන බිහිවීම. * පැරණි ඉන්දීය අද්‍යාපන ආයතන ක්‍රමය ආරම්භයේදීම පොදු අධ්‍යාපන ක්‍රමයක් වීම. * බ්‍රාහ්මණ හා ක්ෂත්‍රීය යන උසස් කුළ වල අයට පමණක් මෙම අධ්‍යාපන වරප්‍රසාද හිමිවීම. * අධ්‍යාපන ඒකාධිකාරය බමුණන් සතු වූ අතර, බමුණු ආශ්‍රමවල නේවාසිකව නැවතී මෙන්ම ඇඳුරන් ළඟට ගෙන්වා ගෙන ඉගැන්වීම සිදුවිය. * මෙම අධ්‍යාපන ක්‍රමය පසුකාලීනව ආරාම ආශ්‍රිතව සාමූහික පොදු අධ්‍යාපන ක්‍රමයක් ලෙස විකාශනය වීම. * විශ්ව විද්‍යාලබිහිවීම. * උසස් අධ්‍යාපන දියුණුවට රජවරු අනුග්‍රහය දැක්වීම. තක්ෂිලාව භාරතයේ මෙන්ම ලෝකයේ පැරණිම විශ්ව විද්‍යාලය ලෙස සැලකිය හැකි වීම.